ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

இலங்கையின் பிரதம அமைச்சர்

Prime Minister of Sri Lanka

ශුභාශිංසන පණිවුඩය

අන්ධකාරය පරදා ආලෝකය උදා කරමින්, නපුරට එරෙහිව යහපත ලැබූ ජයග්‍රහණය සංකේතවත් කරන දීපාවලි උත්සවය, ආධ්‍යාත්මික ශුද්ධියෙන් පිරි මංගල්‍යයකි.

පහන් දැල්වීමෙන් නිවෙස් ආලෝකවත් වනවා සේම, අපගේ සිත් තුළ ඇති ද්වේෂය, ඊර්ෂ්‍යාව සහ අඥානකම නමැති අන්ධකාරය දුරු කරමින් ප්‍රඥාවේ හා කරුණාවේ පහන දැල්වීමට මෙම උතුම් දිනය අපට කදිම අවස්ථාවක් ලබා දෙයි.

ශ්‍රී ලංකාව වැනි බහුජාතික, බහුආගමික රටක දීපාවලී උත්සවය යනු අප අතර ඇති අන්‍යෝන්‍ය අවබෝධය, සංහිඳියාව සහ සහයෝගීතාව තවදුරටත් තහවුරු කරලීමට ලැබෙන මහඟු අවස්ථාවක් බව මම විශ්වාස කරමි.

විවිධත්වයෙන් අනූන අපගේ සංස්කෘතික බැඳීම් ශක්තිමත් කරමින්, ජාති, ආගම් භේදයකින් තොරව එකම මව්බිමක් ලෙස ඉදිරියට යාමට දීපාවලී උත්සව සමයේදී අප සැම අධිෂ්ඨාන කරගත යුතුය.

දීපාවලී දිනය ලක් වැසි ලෝවැසි සියලු හින්දු භක්තිකයින්ට සතුට, සාමය, සෞඛ්‍යය සහ සමෘද්ධිය පිරි දිනයක් වේවායි ප්‍රාර්ථනා කරමි!

ආචාර්ය හරිනි අමරසූරිය
අග්‍රාමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය